# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පළාත් සභා ඡන්ද විමසීම්
## (සංශෝධන)

**1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින්
2017 සැප්තැම්බර් මස 19 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 අගෝස්තු මස 03 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[204 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන)

එල්. ඩී. — ඕ. 40/2017.

## 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2017 අංක      දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1988 අංක 2 දරන පනතේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඉ වන ව්‍යවස්ථාව" යන වචනවල සහ ඉලක්කම්වල සිට "කොමසාරිස්වරයා විසින් පළ කරනු ලැබිය යුතු ය." යන වචන දක්වා ඇති සියලු වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඈඈ ව්‍යවස්ථාව ප්‍රකාරව නිශ්චිතව දක්වනු ලබන දිනයේ සිට සතියක් ඇතුළත කොමසාරිස්වරයා විසින් සියලුම පළාත් සභාවලට ඡන්ද විමසීමක් පැවැත්වීමේ තම අදහස පිළිබඳ දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.